# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1800/6 - 2013 මාර්තු මස 05 වැනි අඟහරුවාදා - 2013.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.බී. 21/1978 (VIII).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, මේ නියමය මගින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද සහ සමාගම් අංක පීබී 4833 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව පාසල සම්බන්ධයෙන් වූ වාර්තාවක්, ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ ලබාගෙන ඇති හෙයින්, මෙහි උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව දක්වා ඇති සහ ඊට අනුරූපව මෙහි උපලේඛනයේ II වන තීරයෙහි කෙටි යෙදුම්වලින් දක්වා ඇති උපාධි පාඨමාලාවන් සහ පශ්චාත් උපාධි පාඨමාලාවන් මගින්, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 23 දරන පනත යටතේ පිහිටුවන ලද ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයට (NIBM) අයත් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්වය පාසල (NSBM), උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් මේ නියමය මගින් පිළිගනිමි.

**උපලේඛනය**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *උපාධි පාඨමාලාවන්/පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන්* | *උපාධි පාඨමාලාවන්/පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා කෙටි යෙදුම්* |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (මානව සම්පත් කළමනාකරණ විශේෂඥ) | BSc, BM (HRM) Sp. NSBM |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (කාර්ය සම්පාදන කළමනාකරණය) | BSc, BM (LM) Sp. NSBM |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (කාර්මික කළමනාකරණය විශේෂඥ) | BSc, BM (IM) Sp. NSBM |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ව්‍යාපෘති කළමනාකරණ විශේෂඥ) | BSc, BM (PM) Sp. NSBM |
| තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | BSc, MIS Sp. NSBM |

1A - PG 0 1572— 835 (2013/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *උපාධි පාඨමාලාවන්/පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන්* | *උපාධි පාඨමාලාවන්/පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා කෙටි යෙදුම්* |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | PGDip (BM) NSBM |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | PGDip (HRM) NSBM |
| කාර්මික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | PGDip (IM) NSBM |
| ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | PGDip (PM) NSBM |
| පරිගණක ජාල පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | PGDip (CN) NSBM |
| මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | PGDip (SE) NSBM |

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 23 දරන පනත මගින් පිහිටුවන ලද ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය සම්බන්ධයෙන්, ඉහත සඳහන් පනතේ 25 අ වගන්තිය යටතේ සාදන ලද 2009 ඔක්තෝබර් 20 දිනැති සහ අංක 1624/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමය, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

03 - 816

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.